## සූටික්කා

අසූටික්කා ගස් අතු උඩ
පැන පැන යනවා
ගසින් ගසට පැන පැන
ඌ කෑම සොයනවා
උදෑසනම මිහිරි ගීත අපට කියනවා
මලින් මලට පැන පැන
ඌ මල් පැණි බොනවා

පුංචි පුංචි කෝටු ගෙනැත්
කූඩු හදනවා
උදෑසනින් කෑම සොයා පිටත්ව යනවා
පුංචි හොටෙන් කෑම ගෙනැත්
පැටව්ට දෙනවා
කුරුළු පැටව් සන්තෝසෙන්
ගීත ගයනවා

♦ ***යසෝදා සමෘධි බණ්ඩාර***
කෑ/ බාලිකා මහා විද්‍යාලය
කෑගල්ල **Sri Lanka**

## ගොවි ජීවිතය

හිමිදිරි උදයේ නැගිට
කහට කෝප්පය තොලගා
උදැල්ල කර තබාගෙන
පිය නගයි කුඹුරට
සිතුවිලි දහසක් පොදි බැඳගෙන
ජීවිතයට මුහුණ දීමට
සිත දැඩි කරගෙන
කරයි ගොවිපළේ වැඩ
හිරු රැසින් ගත වෙලී
එදා වේල පිරිමැසීමට
ගොවිපළ මුල්කරගෙන
ජීවිතය සරුසාර කරගැනීමට
ලැබේවා අස්වැන්න
එයයි ප්‍රාර්ථනය !

♦ ***ජේ. ඒ. ඉනෝකා සමන්ති***
*හල්මිල්ලකැටිය මහවිදුහල*
*ඇඹිලිපිටිය* **Sri Lanka**

**To young readers:** Send us your poetry by post or e-mail to be published on this page.



**Children's Corner**

## Fork ගෑරුප්පුව



Forks were considered scandalous when they were seen in the 11th century. They were introduced at the wedding of a Greek princess who died shortly after the occasion. In Thailand, it is still considered bad form to bring food to your mouth with a fork - you are supposed to use a fork to put food into your spoon.

**ගෑ**රුප්පුව 11 වන ශත වර්ෂයේදී ලැජ්ජා සහගත දෙයක් ලෙස සැලකිණ. ග්‍රීක රජකුමරියකගේ විවාහ මංගලායේදී ගෑරුප්පු පාවිච්චි කළ බවත්, එම උත්සවයෙ-න් ටිකකට පසු ඇය මියගිය බවත් කියති. තායිලන්තයේ අදත් ගෑරුප්පුවකින් ආහාර කටට දමාගැන්ම අශෝභන ක්‍රියාවක් ලෙස සැලකෙන අතර එ රටේ ගෑරුප්පුව යොදා ගන්නේ හැන්දට කෑම පුරවා ගැන්ම පිණිසය.


♦ ***Auntie Ramani*** - ***රමණී නැන්දා***

## හෝ ගා වැස්ස වහිනවා

වළා ඇදෙනවා
පොදත් වැටෙනවා
දේදුන්නක් හෙමින් ඇවිත්
හැඩ පෙන්වනවා

සුළං හමනවා
විදුලි කොටනවා
ගොර මාමා හෙමින් ඇවිත්
මොර හඬ දෙනවා

කාණු පිරෙනවා
ඉතිරී යනවා
ඉර මාමා හෙමින් ඇවිත්
එබිල බලනවා



♦ **හෙමන්ශා ජයසේකර**
**බිෂොප් විදුහල**
**කොළඹ Sri Lanka**


**ලංකා බැංකුව**
**BANK OF CEYLON**

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

***ලන්ඩන් ශාඛාව***




**No 1, Devonshire Square, London EC2M 4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**




# මහා බ්‍රිතාන්‍යයේ ශ්‍රීලංකා සංඝ සභාව

**ඒ**ක්සත් රාජධානියේ විවිධ ප්‍රාන්තයන්හි වැඩවසන ශ්‍රීලාංකික භික්ෂූන් වහන්සේලා රාශියක් ගිය මැයි මස 27 වෙනි බුද දින ලන්ඩන් බෞද්ධ විහාරයට වැඩම කළහ. ඒ මහා බ්‍රිතාන්‍යයේ ශ්‍රීලංකා සංඝ සභාව යළි පුබුදුවාලීම සඳහාය. 1991 දී මෙම සංඝ සභාව මුල් වරට පිහිටුවන ලද්දේ ලන්ඩන් විහාරාධිපතිව වැඩවිසූ බ්‍රිතාන්‍යයේ සංඝනායක ධූරය දැරූ අපවත්වී වදාළ පූජ්‍ය මැදගම වජිරඥාණ ස්වාමීන් වහන්සේගේ මූලිකත්වයෙනි.

මෙම සභාව ලෝක බෞද්ධ සංඝ සභාවේ ශාඛාවක් ලෙෂ ආරම්භ වූ අතර 1998 සිට වජිරඥාන නාහිමියන් ගිලන්වීම නිසා මේ තාක් වසර 11ක් අකර්මණ්‍යව පැවතියේය.

***අනුශාසකවරු*** - පූජ්‍ය පහලගම සෝමරතන නාහිමි, පූජ්‍ය ගලයායේ පියදස්සී නාහිමි
***සභාපති***- පූජ්‍ය බෝගොඩ සීලවිමල නාහිමි
***උප සභාපතිවරු***- පූජ්‍ය විතාරන්දෙනියේ කස්සප නාහිමි
පූජ්‍ය පිදිවිල්ලේ පියතිස්ස හිමි
***ලේකම්*** - පූජ්‍ය අකුරළ සමිත හිමි
***උප ලේකම්*** - පූජ්‍ය බී. ආනන්ද මංගල හිමි
***භාණ්ඩාගාරික*** - පූජ්‍ය තවලම බන්දුල හිමි
***විධායක කමිටුව*** - පූජ්‍ය සීලවිමල නාහිමි
පූජ්‍ය විතාරන්දෙනියේ කස්සප නාහිමි
පූජ්‍ය පිදිවිල්ලේ පියතිස්ස හිමි, පූජ්‍ය කබලෑවේ සිරි-සුමන හිමි, පූජ්‍ය තවලම බන්දුල හිමි, පූජ්‍ය ආනන්ද මංගල හිමි, පූජ්‍ය ගුන්නෑපානේ සුමනාරාම හිමි, පූජ්‍ය පෙතිගමුවේ හේමරතන හිමි, පූජ්‍ය එච්. ප්‍රඥාසාර හිමි පූජ්‍ය කඹුරාවල රේවත හිමි, පූජ්‍ය අකුරළ සමිත හිමි
***සංවිධායක කමිටුව*** - පූජ්‍ය මාකුරේ මංගල හිමි
පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි
පූජ්‍ය නාහල්ලේ රාහුල හිමි

මෙම සංඝ සභාවේ පරමාර්ථය එක්සත් රාජධානියේ සියළු බෞද්ධ විහාර එක ඒකකයක් ලෙස සමගි දාමයෙන් කටයුතු කිරීමය. එසේම බුදුදහම ව්‍යාප්ත කරලීමේ වඩා සාරවත් ක්‍රම හුවමාරු කරගැන්මට මෙන්ම ප්‍රාදේශික, ජාතික හා විදේශික වශයෙන් පැනනගින යම් ගැටළු සහිත අවස්ථාවන්හිදී සියළුම සංඝයා වහන්සේ එක හඬක් වශයෙන් නැගී සිටීමේ ශක්තිය ඇතිකර ගැන්මය.

***සුබ සංඝස්ස සාමග්ගී*** යනුවෙන් සංඝයාගේ සමගිය ලොවට සැපතකැයි බුදුන් වහන්සේ වදාළහ.

**එය එසේම වේවා !**


## NON RESIDENT FOREIGN CURRENCY ACCOUNTS (NRFC)
## අනේවාසික විදේශ මුදල් ගිණුම් විස්තර

- ✷ අනේවාසික ඉතිරිකිරීමේ ගිණුම් - ඇමරිකානු ඩොලර් **5** කින් හෝ ඊට සමාන වටිනාකමින් යුත් වෙනත් විදේශීය මුදල් වලින් ඇරඹිය හැකිය.
- ✷ අනේවාසික ස්ථිර ගිණුම් - ඇමරිකානු ඩොලර් **1000** කින් හෝ ඊට සමාන වටිනාකමින් යුත් වෙනත් විදේශීය මුදල් වලින් ඇරඹිය හැකිය.
- ✷ කාලය මාස **1, 3, 6** හෝ **12**

### ලැබෙන වාසි

- ✷ මුදල් ගනුදෙනු යූරෝ, ඇමරිකානු ඩොලර්, බ්‍රිතාන්‍ය පවුම්, ස්විස් ප්‍රැන්ක්, ඕස්ට්‍රේලියානු ඩොලර්, ජපන් යෙන්, සිංගප්පූරු ඩොලර් සහ කැනේඩියානු ඩොලර් මගින් කළ හැකිය.
- ✷ වාසිදායක පොලී අනුපාත සමග අනේවාසික ගිණුම් වලින් උපයන පොලියට අමතර **20 %** ක රුපියල් බෝනස් මුදලක් ද ගෙවනු ඇත.
- ✷ උපයන පොලිය බදුවලින් තොරය.
- ✷ රුපියල් ලක්ෂයේ සිට මිලියනය දක්වා තැන්පතුවලට නොමිළේ ජීවිත රක්ෂණ
- ✷ ලොවපුරා ඒටීඑම් මුදල් යන්ත්‍රයන්ගෙන් මුදල් ලබාගැන්මට පහසුව.
- ✷ අනේවාසික ගිණුම් ඇති අයට ස්ටර්ලින් පවුම් ණය ලබාගැන්මේ පහසුකම් ලන්ඩන් ලංකා බැංකු ශාඛාවෙන්.
- ✷ ලොව ඕනෑම රටකට මුදල් යැවීමේ සහ ඒ රටවලින් මුදල් ගෙන්වා ගැනීමේ හැකියාව.

### ගිණුමක් ඇරඹීමට තිබිය යුතු සුදුසුකම්

- ✷ විදේශයේ රැකියාවෙහි නියුතු හෝ ශිෂ්‍යත්ව ලබා විදේශයේ ඉගෙනුම ලබන ශ්‍රී ලාංකිකයන් වීම.
- ✷ ශ්‍රීලංකාවේ උපත ලද, එහෙත් විදේශගමන් බලපත්‍ර දරණ අය වීම.

වැඩි විස්තර සඳහා ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවෙන් විමසන්න. නැතහොත් **www.boc.lk** ලංකා බැංකු වෙබ් අඩවියට පිවිසීමෙන්ද ඔබට අනේවාසික ගිණුමක් ඇරඹිය හැක. ඔබට අවැසි සියළුම විස්තර එම වෙබ් අඩවියේ අඩංගුය.

ජාතියේ මහා පහන් ටැඹ ලංකා බැංකුවයි.



***Srilanka Information Site*** ***ශ්‍රී ලංකා තොරතුරු අඩවිය***
**www.srilankans.com**